# මිහින්තලේ මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන සමකාලීන භාෂාව හා ව්‍යාකරණ විධි පිළිබඳ විමර්ශනයක්

කේ.එන්.එම්. පීරිස්

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nisansalamadhu97@gmail.com

**මුඛ්‍ය පද** - ශ්‍රී ලංකාවේ අභිලේඛන, මූල බ්‍රාහ්මී ශිලාලේඛන, මිහින්තලේ , සිංහල භාෂාව, සිංහල ව්‍යාකරණ.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී ශිලාලේඛනවලින් ලැබෙනුයේ ඉමහත් පිටිවහලකි. සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික හා ආගමික තොරතුරු මෙන් ම පුරාක්ෂර විද්‍යාව හා භාෂා භාවිතය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් මෙමගින් අනාවරණය කරගත හැකිවේ. මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ අක්ෂර භාවිතයක් පැවති බවට සාහිත්‍යය මූලාශ්‍රගත තොරතුරුවලට අමතරව පුරාවිද්‍යාත්මක සාධක රැසක් ද මේ වන විට හෙළිදරව් කරගෙන ඇති අතර බුදුදහම ප්‍රචලිත වීමත් සමඟ බිහිවූ ආරාම හා සබැඳි පැරණිතම ශිලා ලේඛන ලෙස මිහින්තලේ ආරාම පරිශ්‍රයෙහි ඇති මූල බ්‍රාහ්මී ලිපි හඳුනාගත හැකි ය. මිහින්තලේ කන්ද, රාජගිරිලෙන කන්ද, ආනෙකුට්ටි කන්ද හා රජරට විශ්වවිද්‍යාල භූමිය ආශ්‍රිතව පිහිටි එම ලිපි, සංඛ්‍යාත්මක වශයෙන් 98 වේ. ඒ අතරින් ආනෙකුට්ටි කන්දේ (IC: No 74) හා රජරට විශ්ව විද්‍යාල භූමියේ (IC: No 75) ඇති ගිරි ලිපි දෙක හැරුණු විට, සෙසු ලිපි සියල්ලම ලෙන් ලිපි වේ. (IC:I:1-93e:මුදියන්සේ,2000:49-59) ක්‍රි.පූ.3-ක්‍රි.ව.1 කාලවකවානුවට අයත් මෙම පැරණි ලිපිවලින් ආදී අනුරාධපුර යුගයේ භාෂා භාවිතය හා ව්‍යාකරණ විධි පිළිබඳව විමර්ශනයක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා පාදක කර ගන්නා ලද්දේ දැනට ප්‍රකාශයට පත් වී ඇති, මිහින්තලේ ආරාම සංකීර්ණයට අයත් ශිලාලේඛනයි. ඒ අනුව, ඒ පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කිරීම මෙම අධ්‍යනය සඳහා භාවිතයට ගන්නා ලද පර්යේෂණ ක්‍රමවේදය වේ.

## සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මී ශිලා ලේඛන විෂයෙහි පොදුවේ දැකගත හැකි ආදි අනුරාධපුර යුගයේ භාෂාව පිළිබඳ කරුණු ගණනාවක් ම මිහින්තලයේ ලිපි ඇසුරෙන් හඳුනාගත හැකි විය. ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මී අක්ෂර මාලාව හා ඉන්දියාවේ අශෝක අක්ෂර අතර සුළු වෙනස්කම් කිහිපයක් හැරුණු විට පුරාක්ෂර විද්‍යාත්මක වශයෙන් සමානත්වයක් හඳුනාගත හැකිය වුවත් භාෂා ව්‍යවහාරයේදී පරස්පරතා කීපයක්ම දැක ගත හැකි ය. අශෝක ලිපිවල දීර්ඝ අක්ෂර හා මහාප්‍රාණාක්ෂර භාවිතය සුලබව දැකිය හැකි ය. එහෙත් ශ්‍රී ලාංකේය මූල බ්‍රාහ්මී ලිපිවල එවැනි අක්ෂර යෙදුණු අවස්ථා අල්පය. උදා:

*"සවනා විජිතසි දෙවානංපියසා පියදසිනා ලාජිනෙ.."*- අශෝක ගිරි ලිපි අංක 02 (ඥාණවිමල හිමි,1966 : 13 )

*"දෙවනපිය මහරඣහ බරියය බකිනිය උපශික වරුණදතය ලෙණෙ "*- (IC i : 2)

මිහින්තලේ ලිපිය ඇසුරින් එවැනි දීර්ඝ අක්ෂර ලුහුකොට දක්වා ඇති තවත් නිදසුන් කිහිපයක් මෙසේය. උදා :

- ආගත - අනාගත ⟶ අගත අනගත (එම:1)
- විශාක ⟶ විශක (එම: 5)

මාහප්‍රාණාක්ෂර අල්පප්‍රාණාක්ෂර ලෙස දැක්වීම මෙම ලිපි ඇසුරෙහි සුලභව දැකගත හැකිය. උදා:

- හරිය ⟶ බරිය (එම: 4)
- ථෙර ⟶ තෙර (එම: 6 1)

එහෙත් ඇතැම් විට අල්පප්‍රාණාක්ෂර මහප්‍රාණාක්ෂර ලෙස දැක්වූ අවස්ථා කීපයක් ද මෙම ලිපි ඇසුරින් හඳුනාගත හැකි ය. උදා:

- ජෝතිසේන ⟶ ඣොතිශෙන (එම: 1)
- මහරජ ⟶ මහරඣ (එම: 2)

එමෙන්ම ඇතැම් ලිපිවල විරල වශයෙන් ''ස'' කාරයට ''හ'' කාරය ආදේශ වීමක් ද දැකිය හැකිය. උදා:

- යසසිනී ⟶ යහශිනී (එම: 89)

මේ හැරුණු විට,සංයුක්තාක්ෂර වෙන් වශයෙන් තනිව ලිවීම මෙම ලිපි ඇසුරෙහි සුලභවම හඳුනාගත හැකිය. උදා:

- පුත්‍ත ⟶ පුත (එම: 60)
- ධම ගුත ⟶ දම ගුත (එම: 60)

මෙම ලිපිවල ශ, ෂ, හා ස යන අක්ෂර තුනම වෙනුවට ශ, ස යන අක්ෂර දෙක පමණක් භාවිතයට ගෙන ඇති අතර සංස්කෘතියෙහි ස කාරය යෙදෙන තැන්වල පවා ශ කාරය යෙදී තිබේ. ඒ අනුව මෙම අක්ෂර දෙකේ උච්චාරණ භේදයක් සලකා නොමැති බව පෙනේ. උදා

- ශගශ (එම: 86)
- ශුමන (එම: 83)
- හුමන (එම: 16)
- සුමන (එම: 01)

ව්‍යාකරණ විධි

- විභක්ති

මෙම ලිපි ඇසුරෙහි මුල්කාලීනව භාවිතයට ගැනුණු විභක්ති තුනක් හඳුනාගත හැකි වේ. එනම් ප්‍රථමා, සම්ප්‍රදාන, සම්භන්ධ විභක්තීන් ය. ප්‍රථමා විභක්ති ඒකවචන සුලභ වන අතර පුත, රඣ, බරණිය, ඣිත, ඣය ඒ අතර වේ. මෙම ලිපි බහුතරයක්ම භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම හා සබැදෙන බැවින් සෑම ලිපියකම පාහේ සම්ප්‍රදාන විභක්තිය දැකගත හැකි ය.

උදා: ''ඣොතිශෙන තෙරශ අතිවශික බත සුමන දත තෙරහ ලෙණෙ <u>ශගශ</u>''(එම: 1)

මෙහි සම්ප්‍රදාන විභක්තිය දැක්වෙනුයේ ශගශ යන්නෙනි. එනම්, <u>සංඝයාට</u> යන්නයි. මෙහි එම ලෙන් පූජා කිරීම සිදු කරනු ලබන තැනැත්තා ඇසුරෙහි සම්බන්ධ විභක්තිය හඳුනාගත හැක්කේ මෙසේ ය. "සුමන දත තෙර<u>හ</u> ⟶ සුමන දත්ත තෙරුන්<u>ගේ</u>" සුමන දත්ත තෙරුන් යනු මෙම ලිපියට අනුව, ජෝතිසේන නම් තෙරුන්ගේ අතවැසියෙකි. එම සම්බන්ධ විභක්තිය නිරූපණය වන්නේ "ඣොතිශෙන තෙරශ" යන්නෙනි. ඒ අනුව, සම්ප්‍රදාන විභක්තිය සඳහා ශ, ස සහ සම්බන්ධ විභක්තිය සඳහා හ, ශ යන ප්‍රත්‍යයන්ද භාවිතයට ගෙන තිබේ.

- සන්ධි

මෙම ලිපි ඇසුරෙහි හඳුනාගත හැකි එකම සන්ධිය වූ කලී පරස්වර ලෝප සන්ධියයි. එම සන්ධිය මූල බ්‍රාහ්මී ලිපි ඇසුරෙහි සුලබ සන්ධියකි. උදා:

ඣිතබි → ඣිත + අබි (දූ කුමරිය) (එම: 34)
මහය → මහ + අය (මහායා - මහාදිපාද) (එම: 75)

ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මී ශිලාලේඛන අතර පැරණිතම මිහින්තලේ ආරාම සංකීර්ණය ආශ්‍රිත ලිපි, ලෙන් පූජා කිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් කෙටි ලිපි වුවද එම ලිපි අනුසාරයෙන් සමකාලීන භාෂාවේ ව්‍යවහාරය සහ ව්‍යාකරණ විධි පිළිබඳව වැදගත් තොරතුරු සම්භාරයක් ම ලබා ගැනීමට මූලාශ්‍ර වේ. ඒ අනුව, සිංහල භාෂාවේ විකාශනය පිළිබඳ කරුණු හැදෑරීමේදී ද මෙම ලිපිවලින් අනාවරණය වන භාෂාත්මක ප්‍රයෝග අතිශයින් වැදගත් වන බව සඳහන් කළ හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**


මුදියන්සේ, එන්., (2000) ***සිංහල ශිලාලේඛන සංග්‍රහය***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණවිමල හිමි, බෙල්ලන, (1966) ***අශෝක ශිලාලේඛන***, කොළඹ: සමයවර්ධන පොත්හල.

***Inscription of Ceylon***, vol.1-1970, (ed S.Paranavitana), Colombo: Dept. of. Archaeology.